17/04/2011 - ඉරිදා ලංකාදීප

**පොදු අරමුණු වෙනුවෙන් නැගී සිටින පුද්ගල බලවේග - මිලින්ද මොරගොඩ**

හැත්තෑ එක් හැවිරිදි, එඩිතර පුද්ගලයෙකුට කළ හැක්කේ කුමක්ද? ඉන්දියාවේ අන්නා හසාරේ Anna Hazare තම ශක්තිය ප්‍රජාතන්ත්‍රවාදී සමාජය හමුවේ අද්විතීය අන්දමට ප්‍රදර්ශනය කළේය. හසාරේ ඉන්දියානු පුරවැසියෙකි. දැඩි ගාන්ධිවාදියෙකු වූ හෙතෙම සමාජයේ ඉහළ පිළිගැනීමක් සහිත අයෙකි. ඔහු තම ජීවිතය පරදුවට තබමින් උපවාසයක් ආරම්භ කළේය. එය දූෂණයට එරෙහිවයි. දූෂණ වංචා ඉන්දියානු දේශපාලනයේ නිතර නැගෙන ඝෝෂාවකි. මේ සම්බන්ධයෙන් සොයා බලා විභාග කරන්නට බලය ලැබෙන නව පණතක් ඉදිරිපත් කිරීම ඔහුගේ ඉල්ලීමයි. නිරාහාරව, මාරාන්තික උපවාසයෙන් පස්වන දිනය එළැඹෙන විට ඉන්දියානු රජය එකී පණත ඉදිරිපත් කරන බවට ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. දැරියක් පිරිනමන ලද වතුර වීදුරුවක් පානය කිරීමෙන් උපවාසය අවසන් විය.

ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක ලෝකයේ විශාලතම රට ඉන්දියාවයි. ඉන්දියානු  දේශපාලනඥයන්ට දූෂණ අක්‍රමිකතා ගැන නැගෙන චෝදනා බරපතලය. ක්‍රමය අපහසුතාවයට පත් කරන මෙම චෝදනා නිසා මහත් ආන්දොලනයක් ඇතිවන අවස්ථා ඇත. රජයේ ක්‍රියාකාරීත්වය ප්‍රශ්න කරන්නට අයිතිය ලැබෙන නව පණතක් ඉන්දියාව පසුගිය කාලයේ සම්මත කළේය. එය තොරතුරු දැනගැනීමේ අයිතිය මහජනතාවට ලැබෙන පණතකි. එම පණත අනුව රජයේ පාලනය විනිවිද පෙනෙන අන්දමට පවත්වාගෙන යන්නට ඉඩ ලැබේ. ඉන්දියානු සමාජය එයින් නතර වූයේ නැත. තොරතුරු දැන ගැනීම පමණක් නොව, දූෂණ හා වංචා වල නිරත දේශපාලනඥයන්ට දඬුවම් කරන්නට අවස්ථාව හිමි විය යුතු බව ඉන්දියානු සමාජය හඬක් නැගීය.

මේ සඳහා සකස් කරන දූෂණ මර්දන පණත් යෝජනාව ඉදිරිපත් වී තිබුණේ 1969 අවුරුද්දේ පටන්ය. ලෝක් පාල් නමින් හඳුන්වන ලද මෙම පණත ස්කැන්ඩිනේවියානු රටවල ඇති ඔම්බුඩ්ස්මන් ව්‍යුහය ආදර්ශයට ගෙන සකස් කර ලද්දකි. හින්දි භාෂාවෙන් ලෝක් යනුවෙන් මහජනතාව හා පාල් යනු ආරක්ෂකයා නැතිනම් පාලකයා යන අදහස ගැබ්විය.

මෙම පණත ලෝක් සභාවෙන් අනුමත වූ නමුත් රාජ්‍ය සභාව එකී පණත අනුමත කරන්නට ඉඩ දුන්නේ නැත. අවුරුදු හතලිස් දෙකක් පුරා අවස්ථා නමයක දී පණත රාජ්‍ය සභාවට ඉදිරි පත් කළ නමුත් එය ප්‍රතික්ෂේප විය. වරක් අගමැති හැර සෙසු දේශපාලනඥයන්ට දූෂණ චෝදනා එල්ල කළ හැකි බවට සංශෝධනය කළේය. තවත් අවස්ථාවක දී එය කළ හැක්කේ කතානායකවරයා ගේ අවසරය ඇතිව පමණකැයි යෝජනා විය. මෙවැනි පණත් මගින් ආණ්ඩු පවත්වාගෙන යාමට බාධා වෙතැයි බලයේ සිටින දේශපාලනඥයෝ විශ්වාස කළහ. තමන්ට දඬුවම් නියම කිරීමට අවශ්‍ය නීති සම්මත කිරීමට තමන්ම උනන්දුවන රටාවක් ඉන්දියානු දේශපාලනයේ නැති බව පෙනෙන්නට තිබිණ. අන්නා හසාරේ උපවාසය අරඹන්නේ  මෙම පණත සම්මත කර ගැනීමේ ඒකායන අරමුණ ඇතිවය.

පුද්ගලයෙකු සතු බලය කොතරම්ද? ටියුනීසියාව, ඊජිප්තුව හා ලිබියාව වැනි රටවල් හරාහා හමාගිය අලුත් විප්ලව පෙන්නුම් කළේ පුද්ගලයන්ට ඇති ශක්තියයි. බලවත් රාජ්‍යයන්ට පුද්ගලයන්ගේ සටන්කාමී ශක්තිය හමුවේ පසු බසින්නට සිදුවිය. ඉන්දියාවේ සිදුවූයේ ත් එයයි. දූෂණ මර්දන පණත සම්මත කරන ලෙස බල කරමින් අන්නා හසාරේ සිය උපවාසය අරඹන විට එය පුද්ගලයෙකු ගේ එඩිතර සිතිවිල්ලක් පමණකි. එනමුත් දිනෙන් දින එහි බලය වැඩිණ. සිවිල් ජනතාව එකතු විය. මාධ්‍ය අත්වැල් බැඳ ගත්තේය. තරුණ තරුණන් රොක් වූ අතර ඔවුන් තාක්ෂණය පාවිච්චි කළහ. වෙබ් අඩවි, ෆේස් බුක් හා ට්විටර් වැනි තාක්ෂණ ජාල සමග විශාල බලවේගයක් නිර්මාණය විය. වසර හතලිස් දෙකක් තිස්සේ මග හරිමින් ඇති පණත ගැන සමාජය තදින් කතා කරන්නට පටන් ගත්තේය. විපක්ෂ දේශපාලනඥයන් මෙම උපවාසයට සහය දෙන්නට ඉදිරිපත් විය. විශේෂත්වය වූයේ එය ප්‍රතික්ෂේප වීමයි. දූෂණ මර්දන පනත් කෙටුම්පත මහජන ව්‍යාපාරයක් බවට පත්වූයේ එවැනි තීන්දු සමගය. එය සාර්ථක විය. පුද්ගලයෙකු ගෙන ගිය අරගලය මහජන ව්‍යාපාරයක් සේ නැගී විසිරී පැතිරී ගියේය. ඉන්දීය රජයට මෙම ලෝක්පාල් පණත සම්බන්ධයෙන් තීන්දුවක් ගන්නට සිදුවිය.

ඉන්දීය අගමැතිවරයා නව දූෂණ මර්දන පණත සම්මත කිරීමට දින නියම කළ අතර පණත කෙටුම් පත් කිරීමට සම්පාදක මණ්ඩලයක් පත් කළේය. එම මණ්ඩලයට අන්නා හසාරේ ඇතුළුව ඇමතිවරු,

විපක්ෂ නියෝජිතයන් සිවිල් සමාජ නියෝජිතයන් දස දෙනෙකු තොරා ගෙන ඇත. පණත් කෙටුම්පත සකස් කරන ආකාරය මහජනතාවට ග්‍රහණය කර ගත හැකිවන පරිදි විවෘතව කරන්නටත් සියලු සාකච්ඡා පටිගත කිරීමටත් තීරණය වී තිබේ. උපවාසයේ දී යෝජනා කළ පරිදි මෙම දූෂණ මර්දන පනත ක්‍රියාත්මක කිරීමට වත්මන් අගවිනිසුරු හෝ හිටපු අගවිනිසුරුගේ සභාපතිත්වයෙන් යුත් තිදෙනෙකුගේ කමිටුවක් පත්වන අතර හිටපු හෝ දැනට සේවය කරන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකු එය නියෝජනය කරනු ඇත. වසර හතලිස් දෙකක් තිස්සේ කල් මරමින් තිබුණ පැරණි පණත අනුව වරදකරුවෙකු වන පුද්ගලයෙකුට මාස හයක සිට අවුරුදු හත දක්වා දඬුවම් කළ හැකි යැයි යෝජනා වී තිබුණත් දැන් යෝජනා වී ඇත්තේ අවුරුදු පහක සිට ජීවිතාන්තය දක්වා දඬුවම් කළ හැකි පරිදි පණත් කෙටුම්පත සකස් කිරීමටය. කලින් පොලිස් බලතල ඇතුලත් නොවූ නමුත්, දැන් පොලිස් බලතල හා ඕනෑම පුද්ගලයෙකුගෙන් පැමිණිලි බාරගෙන විභාග කරන්නට බලය ලැබෙන පණතක් වශයෙන් පුළුල් පරාසයකට විහිදෙනු ඇතැයි සැලකේ. ප්‍රජාතන්ත්‍රවාදයේ ශක්තිය මවිත කරන එකකි. මෙම සිදුවීම මගින් පොදු යහපත වෙනුවෙන් පුද්ගලයෙකුට කළ හැකි විප්ලවය මැනවින් විදහා දැක්වීය.

ශ්‍රී ලංකාවේ ද දේශපාලනඥයන් ගැන නොයෙකුත් චෝදනා නැගෙයි. බලයේ නැති පුද්ගලයෝ බලය ඇති පුද්ගලයන්ට ඇඟිල්ල දිගු කරති. මහා පරිමාන වංචා දූෂණ ගැන චෝදනා කරයි. මේවායේ ඇත්ත නැත්ත විභාග කරන්නේ නැත. අවස්ථාවාදීය. අවංක දේශපාලනඥයෙකුට පවා නැගෙන චෝදනා නිසා ඇති කරන පැල්ලම දරුණු එකකි. කීර්තියට හානි සිදුවෙයි. මැතිවරණයේ දී චෝදනා එල්ල වන පුද්ගලයා පරාජය වන අතර චෝදනා එල්ල කළ පුද්ගලයා බලයට පත්වෙයි. යළිත් ඇතිවන්නේ පරණ චක්‍රයමය. බලය ඇති තැනට දූෂණය ද එකතු වනු ඇතැයි මහජනතාව සිතති. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්නට ස්වාධීන කොමිසම් ඇති කරන ලෙස හඬක් නැගෙයි. ස්වාධීන කොමිසම් ඉන්දියාවේ නැත. එරට ඇත්තේ අධිකරණ පද්ධතියයි. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන අලුත් පණත් මගින් අධිකරණයේ බලය වැඩි වෙයි. අපට අල්ලස් හෝ දූෂණ කොමිසමක් ඇත. තවත් කොමිෂන් සභා පත් කරන ලෙස ඉල්ලයි. ක්‍රමය නිවැරදි කරන ලෙස දේශපාලනඥයන්ගෙන් ඉල්ලා සිටීම සාර්ථක විය හැකි උපායක් ද?

ඉන්දියාවේ ලෝක්පාල් පණත සකස් කරන ආකාරය දර්ශන පටිගත කරයි. පසුව එය විකාශය කරනු ඇත. ඉන්දියානු පාර්ලිමේන්තුවේ විවාද සජීවී ව දැක බලා ගන්නට ඉන්දියානුවන්ට හැකිය. ඉන්දීය පාර්ලිමේන්තුව විසින් සීමිත බල ප්‍රදේශයකට එය සජීවී ව විකාශය කරන අතර එයින් උපුටා ගන්නා දර්ශන විකාශය කිරීමට එරට රූපවාහිනී නාලිකා වලට හැකිය. මෙරට පාර්ලිමේන්තුවේ සජීවී විකාශ යෝජනාවක් තිබේ. ඒ ගැන තීරණයක් නැත. මැති ඇමතිවරු තමන්ගේ කතා වල පිටපත් මාධ්‍ය වලට නිකුත් කරති. හිතවත්කම අනුව මාධ්‍ය එයින් තමන්ට ප්‍රචාරය කළ හැකි කොටස විකාශය කරති. එයින් පෙන්වන්නේ විවාදයේ සම්පූර්ණ චිත්‍රය නොවේ. ප්‍රතිරූප ගොඩනැගීමකි.

රජයේ මුදල් වැය කරන ආකාරය විමසා බලන්නට මහජනතාවට අයිතිය හිමිකරන තොරතුරු දැනගැනීමේ පණත් කෙටුම්පතක් යෝජනා කර තිබේ. ආණ්ඩු පක්ෂය එයට උනන්දුය. විපක්ෂය එය ඉදිරියට ගෙන යන්නට සූදානම්ය. මහජන සංවිධාන මෙවැනි පණතක් මගින් රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වෙතැයි මතයක් ඇති කරයි. එනමුත් එයින් ඔබ්බට එහි තීරණ ගැනෙන්නේ නැත.

ප්‍රජාතන්ත්‍රවාදයේ හරය මහජනතාව වෙනුවෙන් රාජ්‍යය පාලනය කිරීමයි. මහජන නියෝජිතයන්ට ක්‍රියාකරන්නට සිදුවන්නේ මහජන මතය අනුවය. ඡන්දය දිනා ගැනීමෙන් පසු මහජනතාව අමතක කරන ස්වකීය බලය හා ප්‍රතිරූපය උදෙසා පමණක් ක්‍රියාකරන මහජන නියෝජිතයන් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල සිටිය හැකිය. එකී කණ්ඩායම ප්‍රතිශතයක් වශයෙන් සුළු එකක් වන්නට ඉඩ තිබේ. එනමුත් එමගින් ඇති කරන අපකීර්තිය විශාල එකකි. ආණ්ඩු අපහසුතාවයට පත් කරන්නට, ආණ්ඩු පෙරලා දමන්නට මෙවැනි දූෂණයට හසු වූ, වංචාවලට සම්බන්ධ නියෝජිතයෙකුට හැකිය. විරුද්ධ මතයක් පැතිරෙන විට, විපක්ෂ සුළු කරුණක් ඔස්සේ දැවැන්ත ප්‍රචාරයක් ගෙන යන විට සත්‍යය කුමක් ද යන්න නිශ්චය කර ගැනීම පහසු එකක් නොවේ.

ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධව ලෝකයේ මුහුණුවර වෙනස් වෙමින් තිබේ. පුද්ගලයන් නැගී සිටින තත්ත්වයට එය සියුම් ලෙස වර්ධනය වී ඇත. අලුත් මතවාද ගොඩනගන්නට තොරතුරු තාක්ෂණය

උපකාර වෙයි. අසාධාරණය හා අයුක්තිය වෙනුවෙන් නැගී සිටින බලවේග මතුකරන්නට සන්නිවේදනය ප්‍රබල අවියක් වී ඇත. සිද්ධියක් හමුවේ නැගී සිටින බලවේග එය සාර්ථකව අවසන් කිරීමෙන් පසු තම කාර්ය භාරය නිමකර නිහඬ වෙති. නවීන ලෝකයේ අලුත් බලවේග ඇතිවන්නේ එසේය. දේශපාලන වාසි ගැනීම, පාලන බලය අල්ලා ගැනීම මෙම බලවේගවල අරමුණ නොවේ. එය යථාර්ථයයි. දේශපාලන ක්‍රමය ප්‍රතික්ෂේප කරන එය දූෂිත හා අක්‍රමිකතා වලින් පිරි විශ්වාසය පිරිහී ගිය තැනක් බවට පත්වන විට මෙවැනි විකල්ප බලවේග අත්හදා බලන්නට සමාජය ඉදිරිපත්විය හැකිය.

සිවිල් සමාජය තුළ පැන නැගෙන මෙවැනි බලවේග අන්තවාදයෙන් තොරව වගකීමක් ඇතිව හැසිරෙන්නේ ද යන ප්‍රශ්නය ද සලකා බැලිය යුතු එකකි. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවකට එරෙහිව නැගෙන බලවේග විවිධ පසුබිම්න් ඇතිවිය හැකිය. අන්තවාදී හා සමාජයට හිතකර නොවෙන බලවේග වලට ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ගොදුරුවීම සාධාරණ නැත. වර්තමානයේ පාලකයන් ගේ හැසිරීම දකින බාහිර බලවේග එයට එරෙහිව නිතැතින්ම ප්‍රතිවිරුද්ධ බලවේග ඇති කරයි. එයින් ඇති වන්නේ අනර්ථයකි. ඉන්දියානු අත්දැකීම පෙන්වා දෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ වර්ධනයට හිතකර මධ්‍යස්ථ මත ගොඩනැගෙන විට එයට හිස නැමීමෙන් මහජනතාව හා පාලකයන් අතර විශ්වාසය ගොඩනගන අලුත් සංවාදයකට ඉඩදෙන බව තේරුම්ගත යුතුය. මැද මාවත ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ විශිෂ්ඨතම අත්ද්‍රිකීමයි. පාලකයන් හා මහජනතාව අතර සාධනීය ඉදිරිගමනකට මුල පිරෙන්නේ මැද මාවතෙන් පමණකි.